**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය (ආර්ථික විද්‍යාව) - 2018**

**පළමු සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය**

**ENH 3142 / ELT 3150: පාරිභෝගික අධ්‍යනය සහ අලෙවිකරණය**

**(කාලය - පැය දෙකක් (02) පමණයි)**

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් ලැබේ.**

**නොපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු විය හැක.**

---

1. සමස්ත පරිභෝජන මට්ටම හා ආර්ථික සංවර්ධනය අතර ඇති සබඳතාවය බොහෝ දුරට සමීප වෙමින් පවතී.

   i. ඔබ පාරිභෝගික භාණ්ඩ "කල් පවතින" හා "කල් නොපවතින" භාණ්ඩ ලෙස වෙනස් කර හඳුනා ගන්නේ කෙසේද?
   ii. කුටුම්බ පරිභෝජනයට බලපාන සාධක පරීක්ෂා කරන්න.
   iii. පරිභෝජනය තුළින් කෙතෙක් දුරට කුටුම්බ සුබසාධනය පෙන්වා දෙනු ලැබේද?

2. ඉහළ ජීවන මට්ටමක් භුක්ති විඳින සාපේක්ෂක වශයෙන් ධනවත් වූ සමාජයක්, ඉහළ පොදු පරිභෝජන අවධිය තුළ සිටින්නේ යැයි අර්ථ දක්වනු ලැබේ.

   i. "ඉහළ පොදු පරිභෝජනයේ" ප්‍රධාන ලක්ෂණ මොනවාද?
   ii. සංවර්ධනය වෙමින් පවතින රටවල ඉහළ පොදු පරිභෝජනය කෙතරම් දුරකට දෘශ්‍යමාන වෙයිද ?
   iii. ඉහළ පොදු පරිභෝජනයේ සෘණාත්මක බලපෑම් මොනවාද ?

3. පැරණි ශ්‍රී ලාංකීය සමාජයේ සාම්ප්‍රදායික තිරසර නිෂ්පාදන ක්‍රමය මගින් එහි තිරසර පරිභෝජන පුරුදු පෙන්වා දෙයි.

   i. පැරණි ශ්‍රී ලාංකීය සමාජයේ ප්‍රධාන ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කරන්න.
   ii. මෙකී සමාජයෙහි ආහාර නොවන ද්‍රව්‍ය අවශ්‍යතාවයන් අතිශයින් සීමිත විය. ඔබ මීට එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
   iii. මෙකී සමාජයේ තිරසර ලක්ෂණ ඔබ පරීක්ෂා කරන්නේ කෙසේද?

4. "කාර්මික හා කෘෂිකාර්මික විප්ලව මගින් ඉහළ ගිය ඵලදායිතාවය වර්තමාන සමජයන්හී ඉහළ පරිභෝජනය සඳහා මඟ පාදන ලදී".

   i. ඵලදායිතා සංකල්පය කෙටියෙන් පරීක්ෂා කරන්න.
   ii. ඵලදායිතා වර්ධනයට බලපාන ප්‍රධාන සාධක හඳුන්වන්න.
   iii. ඵලදායිතාවය සහ පරිභෝජනය අතර සම්බන්ධතාවය ඔබ හඳුනා ගන්නේ කෙසේද?

5. ක්ෂණික ආහාර සංස්කෘතිය වේගයෙන් වෙනස් වන සමාජයන්හි ශීඝ්‍රයෙන් වර්ධනය වන හා වඩා හොඳින් ස්ථාපිත වූ පරිභෝජන රටාවකි.

   i. ඉහත ප්‍රකාශය කෙටියෙන් පරීක්ෂා කරන්න.
   ii. පැරණි සමාජවල ක්ෂණික ආහාරවල ලක්ෂණ මොනවාද?
   iii. ක්ෂණික ආහාර සංස්කෘතියේ ප්‍රධානතම සෘණාත්මක බලපෑම් මොනවාද?

6. අලෙවිකරණයේ පදනම වන්නේ පාරිභෝගික අවශ්‍යතා සහ ඔවුන්ගේ තෘප්තිය අනුව ව්‍යාපාරික කටයුතු පිළිබඳව සිතීමයි.

   i. නූතන ආර්ථිකයන්හි අලෙවිකරණ කාර්යභාරය කෙටියෙන් පරීක්ෂා කරන්න.
   ii. අලෙවිකරණ හා විකිණුම් සංකල්ප සංසන්දනය කරන්න.
   iii. නිෂ්පාදකයින් අලෙවිකරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්නේ මන්ද?

7. කෘෂිකාර්මික අලෙවිකරණය යනු කෘෂිකාර්මික යෙදවුම් සැපයීම හා කෘෂිකාර්මික නිෂ්පාදන ගොවිපලේ සිට පාරිභෝගිකයා දක්වා ගමන් කිරීම සඳහා වූ සියලුම ක්‍රියාකාරකම්, ආයතන හා ප්‍රතිපත්ති පිළිබඳව අධ්‍යනය කිරීමයි.

   i. නූතන ආර්ථිකයක කෘෂිකාර්මික අලෙවිකරණයේ කාර්යභාරය කෙටියෙන් හඳුන්වන්න.
   ii. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අලෙවිකරණයේ ප්‍රධාන දුර්වලතා මොනවාද?
   iii. එම දුර්වලතා සඳහා විසඳුම් මොනවාද?

8. පහත සඳහන් ඕනෑම තුනක් **(03)** පිළිබඳව විස්තරාත්මක සටහන් ලියන්න.

   i. ප්‍රධාන ආහාර වර්ග
   ii. විවේක පරිභෝජනය
   iii. ජීවන චක්‍ර කල්පිතය
   iv. සමාජ ආරක්ෂණ ජාලයන්
   v. කුටුම්බ පරිභෝජනය හා වියදම් සමීක්ෂණ

---------------------------------------------------0---------------------------------------------------

**UNIVERSITY OF COLOMBO, SRI LANKA**
**FACULTY OF ARTS**

**Third Year General / BED Degree Examination in Arts (Economics) - 2018**

**First Semester Final Examination**

**ENH 3142 / ELT 3150 – Consumer Studies and Marketing**

***Time Allowed: Two Hours (02) Only***

**Answer any *four* questions. All Questions Carry Equal Marks**
***(Candidates may be penalized for illegible handwritings)***

---

1. The relationship between overall consumption level and economic development is becoming increasingly close.

   i. How do you differentiate consumer goods as 'durable' and 'non-durable'?
   ii. Examine the factors affecting household consumption.
   iii. To what extent will the consumption reflect the level of household welfare?

2. A relatively wealthy society enjoying a high standard of living is interpreted as the stage of high mass consumption.

   i. What are the major characteristics of the 'high mass consumption'?
   ii. To what extent is the high mass consumption visible in developing countries?
   iii. What are negative implications of the high mass consumption?

3. The traditional sustainable production system in the olden Sri Lankan society reflected its own sustainable consumption habits.

   i. Examine the major food items in the olden Sri Lankan society.
   ii. The requirement of non-food items was extremely limited in this society. Do you agree with this? Give reasons for your answer.
   iii. How do you examine the sustainable characteristics of this society?

4. Increasing productivity as a result of industrial and agricultural revolutions pawed the way for high consumption in modern societies.

   i. Briefly examine the productivity concept.
   ii. Identify the major contributory factors for the productivity growth.
   iii. How do you identify the relationship between the productivity and consumption?

5. Fast food culture is a rapidly growing and increasingly well-established consumption pattern in fast moving societies.

   i. Briefly examine the above statement.
   ii. What were fast food characteristics in olden societies?
   iii. What are the major negative implications of the fast food culture?

6. Marketing is based on thinking about the business in terms of customer needs and his satisfaction.

   i. Briefly examine the role of marketing in a modern economy.
   ii. Compare and contrast the marketing and sale concepts.
   iii. Why do producers pay special attention to marketing?

7. Agricultural marketing is the study of all the activities, agencies and policies involved in the procurement of farm inputs and the movement of agricultural products from the farm to the consumer.

   i. Briefly identify the role of agricultural marketing in a modern economy.
   ii. What are the major weaknesses in agricultural marketing in Sri Lanka?
   iii. What are the solutions for those weaknesses?

8. Write detailed notes on any **three (03)** of the following.

   i. Staple diets
   ii. Leisure consumption
   iii. Life Cycle Hypothesis
   iv. Social safety nets
   v. Household consumption and expenditure surveys

---------------------------------------------------0---------------------------------------------------